වාරිමාර්ග අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

## ලංසු කැඳවීම

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් භාවිතයෙන් ඉවත් කරන ලද වාහන, යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය විකිණීම සඳහා මිල ගණන් කැඳවීම**

1. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් විසින් අංක 500, ටී. බී. ජයා මාවත, කොළඹ 10, ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 09 වන මහලේදී **2023.06.20 දින ප.ව. 2.00** දක්වා මෝටර් වාහන, ඉඩම් වාහන, බර වාහන, යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය ටෙන්ඩර් මගින් අපහරණය කිරීම සඳහා මුද්‍රා තබන ලද මිල ගණන් කැඳවනු ලැබේ.

2. ඒ අනුව ශ්‍රී මහවැලි අධිකාරියේ **කොළඹ ප්‍රධාන කාර්යාලය, බී කලාපය - වැලිකන්ද, සී කලාපය - දෙහිඅත්තකණ්ඩිය (තෝඩා ගොවිපල, රත්කිඳ ගොවිපල), වික්ටෝරියා / ඊ කලාපය - දිගන, ඩී කලාපය - මැදිරිගිරිය, එච් කලාපය - (නිරාවිය ගොවිපල/ යාන්ත්‍රික වැඩපල - තඹුත්තේගම), වලව කලාපය - ඇඹිලිපිටිය, එල් කලාපය - වැලිඔය, මහවැලි ආරක්ෂක බලකාය - දිගන, රඹකැන්ඔය කලාපය- මහඔය, මොරගහකන්ද කලාපය - (යාන්ත්‍රික වැඩපල - බකමූණ) ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය (දිගන, රන්දෙණිගල, පොල්ගොල්ල, මාදුරුඔය, මාපාකඩ, බෝවතැන්න)** යන ස්ථානයන්හි දී මෙම වාහන, යන්ත්‍ර සූත්‍ර, අබලි යකඩ ද්‍රව්‍ය **2023.06. 05** දින පෙ.ව.**9.30** සිට **2023.06.19** දින ප.ව. **3.00** දක්වා (රජයේ නිවාඩු දිනයන් සහ සති අන්ත දිනයන් හැර) පරික්ෂා කර බැලිය හැකිය.

3. වාහන සඳහා වෙනම අයදුම්පත්‍රයක් සහ යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය සඳහා වෙනම අයදුම්පත්‍රයක් ලෙස අයදුම්පත් මිලදී ගෙන එම අයදුම්පත්වල අඩංගු එක් එක් කාණ්ඩ සඳහා මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

4. අදාල ලංසු පත්‍රිකා, සමාගම් ලිපි ශීර්ෂයක් මඟින් ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ 07 වන මහලේ මුදල් අංශයේ සහකාර අධ්‍යක්ෂ (මුදල්- වත්කම්/ගබඩා) වෙතින් හෝ ඉහත 02 හි දක්වා ඇති කලාප කාර්යාලවල ගණකාධිකාරී වෙතින් රු. **3500/-** ක ආපසු නොගෙවන තැන්පත් මුදලක් ගෙවා **2023.06.05 දින පෙ.ව. 9.00 සිට 2023.06.19 දින ප.ව.03.00** දක්වා ලබාගත හැකිය. (රජයේ නිවාඩු දිනයන් සහ සති අන්ත දිනයන් හැර)

5. මිල ගණන් ඉදිරිපත් කරනු ලබන කාණ්ඩයන් සඳහා අදාල වන, **ආපසු ගෙවනු ලබන තැන්පතු මුදල** දින 60 ක් වලංගු බැංකු අණකරයක් (Bank Draft) හෝ මුදල් තැන්පතුවක් ලෙස මිල ඉදිරිපත් කිරීමේදී ඉදිරිපත් කල යුතුය.

6. නිසිලෙස සම්පූර්ණ කළ ලංසු පත්‍රිකා ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතුව හෝ දින 60 ක් වලංගු බැංකු අණකරයක් සමග ආයතනයේ නම, ලිපිනය සහ ලියුම් කවරයේ වම්පස කෙලවර **"භාවිතයෙන් ඉවත් කරන ලද වාහන සඳහා මිල ගණන් කැඳවීම"** හෝ **"භාවිතයෙන් ඉවත් කරන ලද යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය සඳහා මිල ගණන් කැඳවීම"** ලෙස සඳහන්කර කවරයේ බහා මුද්‍රා තබා **2023.06. 20 දින ප.ව. 2.00 ට** පෙර ලැබෙන සේ **කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 500** දරණ ස්ථානයේ පිහිටි **ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 9 වන මහලේ අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය, ප්‍රසම්පාදන අංශය** වෙත ලියාපදිංචි තැපෑලෙන් හෝ කුරියර් සේවාව මගින් එවිය යුතුය. නැතහොත් අතින් ගෙනවිත් ටෙන්ඩර් පෙට්ටියට බහාලිය හැකිය. මිල ගණන් විවෘත කිරීම **2023.06. 20 දින ප:ව 2.00** ට එම ස්ථානයේදීම සිදු කරනු ලබන අතර එම අවස්ථාවට අයදුම්කරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පමණක් සහභාගි විය හැකිය. 2023.06. 20 දින ප.ව. 2.00 ට පසු ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

Reference Only

7. සෑම අයදුම්පත්‍රයක් සමඟම අපහරණය කරනු ලබන වාහන, යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය පිළිබඳ විස්තරයක් සපයනු ලැබේ. අදාල ලංසු ලේඛන පරීක්ෂාකර බැලීම සඳහා පමණක් පහත වෙබ් අඩවියේ ටෙන්ඩර්ස් යටතේ පළකර ඇත.

8. මිට්සුබිෂි J-44 ජීප්, මිට්සුබිෂි පැජරෝ, ටොයෝටා ලෑන්ඩ්කෲෂර් යන වර්ගවල ජීප් රථ, මයික්‍රෝ ටොයෝටා, නිසාන් ඩබල් කැබ් රථ, මැසිපර්ගියුෂන් ට්‍රැක්ටර්, ටාටා ලොරි, මැස්ඩා කාර් අපහරණය කරනු ලබන වාහනවලට අයත්වන අතර යන්ත්‍රෝපකරණ හා අබලි යකඩ ද්‍රව්‍ය වලට ලියාපදිංචිය අවලංගු කරන ලද වාහන කැටපිලර්, ලෝඩර්, ජෙනරේටර්, රෝඩ්රෝලර්, ටේලර්, බවුසර්, කෘෂි උපකරණ හා යන්ත්‍ර, ජීප් රථ බොඩි, වාන් දොරටු හා භාවිතා කරන ලද වාහන අමතර කොටස් ආදිය ඇතුලත් වේ.

9. අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කර ඇති තොරතුරු, උපදෙස් හා කොන්දේසි පිළිබඳව මනා අවධානය යොමු කරන ලෙස දන්වා සිටිනු ලැබේ.

10. වැඩිදුර තොරතුරු සඳහා දුරකතන අංක **011 2699417**. වෙබ් අඩවිය : http://www.mahaweli.gov.lk

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය,**
**අංක 500 ටී.බී ජයා මාවත,**
**කොළඹ 10.**

Reference Only